*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක්, සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,082 - 2018 ජූලි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1600 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1615 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1597 - B 81433 — 5,403 (2018/07)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත දක්වා තිබෙන තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පාර්ලිමේන්තු කථා පරිවර්තක තනතුර (ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි)
2. පාර්ලිමේන්තු කථා පරිවර්තක තනතුර (සිංහල/ දෙමළ/ සිංහල)

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2018 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

1. *වැටුප් පරිමාණය* :

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,340 -3 x 755/13 x 1,030 - රු. 62,995 /- වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 37,558 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 75,000.00 පමණ වේ.)

2. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. *අධ්‍යාපන සුදුසුකම්* :

පහත සඳහන් (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් කවර ආකාරයකට හෝ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති අයදුම්කරුවන් හට ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්කළ හැකිය.

(*අ*) ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාවට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබීමත් සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල හෝ දෙමළ භාෂාව විෂයයක් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාවට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

(*ආ*) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම හෝ නව නිර්දේශය යටතේ එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම සහ ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දෙක සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථ ලබා තිබීමත් සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල සහ දෙමළ භාෂා දෙක සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සහ

ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ / ඉංග්‍රීසි භාෂාවට අදාළව හෝ සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල / දෙමළ භාෂාවට අදාළව ගුරු වෘත්තීය හෝ කථා පරිවර්තනය / භාෂා පරිවර්තනය හෝ ජන සන්නිවේදනය වැනි ක්ෂේත්‍රයක වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(*ඇ*) ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන් සඳහා දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙමළ / ඉංග්‍රීසි භාෂණ පරිවර්තක හෝ භාෂා පරිවර්තක ස්ථිර තනතුරක් දරන අයෙකු වීම සහ එම තනතුරේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන් සඳහා දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙමළ / සිංහල භාෂණ පරිවර්තක හෝ භාෂා පරිවර්තක ස්ථිර තනතුරක් දරන අයෙකු වීම සහ එම තනතුරේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ක්ෂණික කථා පරිවර්තන හා භාෂා පරිවර්තනය පිළිබඳ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

*සටහන* : ඉහත 3 (අ), (ආ) හෝ (ඇ) යටතේ සුදුසුකම් සපුරා ඇති ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා

අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවටත් සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වන අතර සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවටත් දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවටත් සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වේ. සමගාමී කථා පරිවර්තනය පිළිබඳ සේවා පළපුරුද්දක් අත්‍යාවශ්‍ය නොවේ.

5. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මුලින්ම වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, සේවයෙහි ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතු ය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2018 ජූලි මස 13 වැනි දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

................................ තනතුර සඳහා ආදර්ශ අයදුම්පත

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss.) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ආ) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය ඃ

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ආ) 2018 අගෝස්තු මස 09 වැනි දිනට වයස ඃ- අවුරුදු :————, මාස :————, දින :————.

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ. පො. ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ඉංග්‍රීසි | | |
| | ගණිතය | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස. (උ/පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |

| උපාධිය | විෂයය ධාරාව | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් ඃ- (සහතික පිටපත් ඇමිණිය යුතු ය.)
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................

10. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

.................................................................................................

.................................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
    - (අ) ආයතනයේ නම හා ලිපිනය :————.
    - (ආ) මුල් පත්වීමේ දිනය :————.
    - (ඇ) දැනට දරන තනතුර :————.
    - (ඈ) මාසික මූලික වැටුප :————.
    - (ඉ) දීමනා :————.
    - (ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
    එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?
    එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

07-974/1

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ගෘහපාලන සහායක තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ගෘහපාලන සහායක තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2018 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "ගෘහපාලන සහායක තනතුර"යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

1. *වැටුප් පරිමාණය* :- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9 x 270/10 x 300/6 x 330-රු. 32,930 /- වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 20,248 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දල මාසික වැටුප රු. 50,000.00 පමණ වේ).

   "ගෘහපාලන සහායක" තනතුරේ අවුරුදු10 ක සතුටුදායක සේවයකින් පසු "ජ්‍යෙෂ්ඨ ගෘහපාලන සහායක" තනතුරට උසස් කරනු ලැබේ.

2. *වයස් සීමාව* :- 2018 අගෝස්තු මස 9 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

3. *අධ්‍යාපන සුදුසුකම්*:- සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්*:- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක, හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස 05කට නොඅඩු වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

5. *පළපුරුද්ද* :- හෝටල් ක්ෂේත්‍රයේ ගෘහ පාලන සහායක හෝ ඒ හා සමාන තනතුරක මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය* :- ලිඛිත/ වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

7. *සේවා නියමයන් හා කොන්දේසි*-

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

   (ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

   (iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

   (v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

   (*අ*) උප්පැන්න සහතිකය,
   (*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (*ඇ*) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

10. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

2018 ජූලි මස 13 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

***ගෘහපාලන සහායක තනතුර සඳහා ආදර්ශ අයදුම්පත***

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss.) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය :————.
(ආ) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය ඃ

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (i) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ii) 2018 අගෝස්තු මස 09 වැනි දිනට වයස ඃ-අවුරුදු :————. මාස :————. දින :————.

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථයන්* | *වර්ෂය* |
|---|---|---|---|
| අ. පො. ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය.)
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................

10. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

.......................................................................................
.......................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) දැනට දරන තනතුර :————.
(ඇ) මුල් පත්වීමේ දිනය :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

---

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

07-974/2

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### අධ්‍යක්ෂ (ආහාරපාන හා ගෘහපාලන සේවා) තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ අධ්‍යක්ෂ (ආහාරපාන හා ගෘහපාලන සේවා) තනතුර සඳහා මනා ශරීර සෞඛ්‍යයකින් සහ විශිෂ්ට චරිතයකින් හෙබි, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරු ස්වයං අභිප්‍රේරිත, ක්‍රියාශීලි කැපවීමෙන් කටයුතු කරන වෘත්තිකයෙකු විය යුතු අතර, ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ගුණාත්මක භාවය සහ සේවා විශිෂ්ටත්වය යන අංශ දෙකෙන්ම ඉහළම තත්ත්වයන් පවත්වා ගැනීමට හැකියාවක් ඇති අයෙකු විය යුතු වේ.

ඔබේ අයදුම්පත ඔබ පිළිබඳ කරුණු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සඳහන් කර, 2018 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුරේ නම සඳහන් කළ යුතු වේ. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය.)

01. *වැටුප* :

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.67,485-4 x 1,630/8 x 2,170 - රු. 91,365 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ මූලික ආරම්භක දළ මාසික වැටුප රු. 135,000.00 පමණ වේ.)

02. *වෙනත් ප්‍රතිලාභ* :

- සීමිත පෞද්ගලික පරිහරණයකට ද අවසර ඇති පූර්ණ නඩත්තුව සහිත වාහනයක්,
- පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන දීමනා.

03. *රැකියාවේ ස්වභාවය* :

ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ඔබ පහත සඳහන් වගකීම් දැරිය යුතු වේ.

- පාර්ලිමේන්තුවේ ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කළමනාකරණය, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
- ආහාරපාන සහ එයට අදාළ වෙනත් ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ගබඩා කිරීම, සැකසීම සහ පිරිනැමීම සඳහා ක්‍රම සහ ක්‍රමවේදයන් සකස් කිරීමත්, පවත්වා ගැනීමත් මෙන්ම ආහාර වේල් සැලසුම් කිරීම මෙන්ම වැඩි දියුණු කිරීම.
- ඒ ඒ ක්ෂේත්‍රයන්හි අවශ්‍ය කරන සනීපාරක්ෂක තත්ත්වයන් සහ ආරක්ෂක මට්ටම් පවත්වා ගෙන යෑමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම සහතික කිරීම.
- නිෂ්පාදනය, වෙළඳ භාණ්ඩ මිල දී ගැනීම, ප්‍රමිතිය සහ පිරිවැය පාලනය, සේවක පුහුණුව ආදිය පිළිබඳව කටයුතු කරන පිරිස් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම මෙන්ම ඵලදායීවූත්, සඵලදායීවූත් ශ්‍රම බලකායක් පවත්වා ගෙන යෑම.
- රජයේ ප්‍රමිතීන්ට අනුකූල අන්දමින් භාණ්ඩ තොග සටහන්, ගිණුම් සහ වාර්තා පවත්වා ගෙන යෑම
- පාර්ලිමේන්තුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග සඵලදායී අන්දමින් සබඳතා සහ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

04. *සුදුසුකම්* :

- ලංකා හෝටල් පාසලේ වසර 4 ක පූර්ණකාලීන ඩිප්ලෝමාව සහ / හෝ ආහාරපාන, අරක්කැමි, ගෘහපාලන හෝ වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍රයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් ඇති පුද්ගලයෙකු වීම, ව්‍යාපාර කළමනාකරණ සුදුසුකම් තිබීම අමතර වාසියක් වනු ඇත.
- ආගන්තුක සත්කාර සේවා අංශයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක් තිබීම.
- විශිෂ්ට සන්නිවේදන සහ අන්තර් පුද්ගල කුසලතා.
- අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට ඇති ඉහළ මූලාරම්භක දක්ෂතා.
- වෙනස්කම් සහ අභියෝගයන්ට සඵලදායී ලෙසින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ නිපුණතාව.
- "මයික්‍රොසොෆ්ට් ඔෆීස්" පරිගණක යෙදුම් පිළිබඳ දැනුම සහ පළපුරුද්ද.
- වයස අවුරුදු 35 - 45 අතර වීම (දැනටමත් පාර්ලිමේන්තු සේවයේ හෝ රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය හට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ)

සටහන : දැනටමත් පාර්ලිමේන්තු සේවයේ නියුතු "IA" වැටුප් කාණ්ඩයේ සහ ඊට ඉහළ කාණ්ඩවල අයට ද (උදා :- විධායක සූපවේදී, ආහාරපාන කළමනාකරු) අයදුම් කළ හැකි ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

06. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔහු/ඇය යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතුය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරු පත් කරනු ලැබීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

07. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික,
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක්,
(අයදුම්කරු රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන්නේ නම් ඉහත (ඉ) හි සඳහන් චරිත සහතික අවශ්‍ය නොවේ).

08. රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

09. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්. එම්. එන්. පී. ඉද්දවල,
කාර්ය මණ්ඩල ප්‍රධානී සහ
පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්.

2018 ජූලි මස 17 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුරකෝට්ටේ,

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

*අධ්‍යක්ෂ (ආහාරපාන හා ගෘහපාලන සේවා)* **තනතුර**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ආ) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය ඃ

පෞද්ගලික ඃ

කාර්යාලයීය ඃ

04. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ආ) 2018 අගෝස්තු මස 09 වැනි දිනට වයස ඃ-අවුරුදු :————. මාස :————. දින :————.

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ. පො. ස. (සා/පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස. (උ/පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |

| උපාධිය | විෂය ධාරාව | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් ඃ- (සහතික පිටපත් ඇමිණිය යුතු ය.)
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

10. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

………………………………………………………………………………………
………………………………………………………………………………………

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර ඃ
   (අ) ආයතනයේ නම හා ලිපිනය :————.
   (ආ) මුල් පත්වීමේ දිනය :————.
   (ඇ) දැනට දරන තනතුර :————.
   (ඈ) මාසික මූලික වැටුප :————.
   (ඉ) දීමනා :————.
   (ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල
සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

07-979

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම-2018 (සීමිත පදනම)

ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ පවතින පුරප්පාඩුව සඳහා සුදුස්සකු තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතුය. අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.08.15 දින වේ.

*සටහන.*-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍ය මණ්ඩලයේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසරක වැඩබැලීමේ කාලයකට යටත් වන අතර, III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නොවූ නිලධාරියකු නම් තනතුරට පත්වී වසර 05ක් ගතවීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතුය.

(iv) අමාත්‍ය මණ්ඩල තීරණවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615 -10x1335-8x1630-17x2170-රු. 110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමිවේ. ශ්‍රේණි ක්‍රමයට අදළ ආරම්භක වැටුප් තලය 2020/01/01 දිනට රු. 76,175 ක් වන අතර වැටුප් පියවර 20 වේ.

04. *සුදුසුකම්* :

(i) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් පිරිනමනු ලැබූ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

(ii) වෘත්තීය සුදුසුකම් :

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ හෝ වෙනත් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය/පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව විධායක මට්ටමේ (SL-1 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයේ) තනතුරක සේවය කිරීම

සහ

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වීම.

(iii) පළපුරුද්ද :

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව, විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ විධායක සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක 07 උපයාගෙන තිබිය යුතුය.

(ii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්විය යුතුය.

(iii) පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබිය යුතුය.

05. *වයස් සීමාව* - අදාළ නොවේ.

06. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. වෙනත් සුදුසුකම් ඃ

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ*

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දෙනු ලබන අතර එම පරීක්‍ෂණයේ දීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. *සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය ඃ*

| ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 45 | අදාළ නොවේ |
| 02 | දේශීය/විදේශ පුහුණුවීම් | 20 | |
| 03 | අතිරේක පළපුරුද්ද | 30 | |
| 04 | සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 | |
| එකතුව | | 100 | |

10. (i) අයදුම් පත්‍රය මේ සමග දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතුවේ. අංක, 1-14 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 15 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම්පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

*සැලකිය යුතුය.*- (අ) අයදුම් පතට අදළ සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය.
(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි හෝ ඒවායේ මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්‍ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතුය.

11. අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන නියෝග, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කළින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ණය සහනදයක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්. එම්. එම්. ආර්. අධිකාරි,
ලේකම්,
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ.

2018 ජුනි මස 26 වැනි දින.

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය***

*ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ලේකම් තනතුර සඳහා අයදුම් පත්‍රය - සීමිත පදනම*

1 (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/ දෙමළෙන්) :…………………………………………………………………

මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :…………………………………………………………………

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :.......................................................................

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...................................................................

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :.............................................................................

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................................................

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

07. උපන් දිනය :- වර්ෂය :————., මාසය :————., දිනය :————.

08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- වර්ෂ :————., මාස :————., දින :————.

09. ජාතිය :————.

10. විවාහක/ අවිවාහක බව :————.

11. පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර :-

විශ්ව විද්‍යාලය :————;<br>
විෂයය ක්ෂේත්‍රය :————;<br>
උපාධිය පිරිනැමූ දිනය :————;<br>
භාෂා මාධ්‍ය :————.

12. නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

13. නීතිඥයකු ලෙස වෘත්තීය පළපුරුද්ද :- වසර ගණන :————.

14. සේවයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :- වසර ගණන :————.

(i) දැනට සේවය කරන තනතුර :————; (ii) පංතිය හෝ ශ්‍රේණිය :————;<br>
(iii) එම ශ්‍රේණියට උසස් කළ දිනය :————; (iv) එම තනතුරට පත්වූ දිනය :————.<br>
(v) එම තනතුරේ ස්ථිර කළ දිනය :————;<br>
(vi) වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————;<br>
(vii) පූර්ව සේවා කාලය පිළිබඳ විස්තර :————;

| | ආයතනය | දැරූ තනතුර | සේවා කාලය (... දින සිට ... දක්වා) |
|---|---|---|---|
| 1. | .......................... | .................. | .......................... |
| 2. | .......................... | .................. | .......................... |

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 ඡේදයට අනුව වෘත්තීය සුදුසුකම් :-

(i) විධායක ශ්‍රේණියේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු ද යන වග :————————;<br>
(ii) විධායක ශ්‍රේණියේ දෙවන ශ්‍රේණියේ නිලධාරියකු නම් දෙවන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්ද යන්න හා නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇත්ද ? :————————.

(iii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් ලබා ගෙන ඇත් ද ? :————————.

(iv) පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත්ද ? :————————————————.

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 09 ඡේදයට අනුව සුදුසුකම් :-

(i) ..........................................................................................................................;
(ii) ..........................................................................................................................;
(iii) ..........................................................................................................................;
(iv) ..........................................................................................................................;
(v) ..........................................................................................................................;
(iv) ..........................................................................................................................;
(vii) ..........................................................................................................................;
(viii) ..........................................................................................................................

17. භාෂා ප්‍රවීණතාව :- (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

අයදුම්කරුගේ සහතිකය

............................................................. වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව) :-

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන ............................. මයා/ මිය/ මෙනවිය මධ්‍යම රජය යටතේ වන ............................. පළාත් සභාව යටතේ වන ............................. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ............................. තනතුරක සේවය කරන බව ද පූර්වාසන්න වසර 07ක කාල සීමාව තුළ ඔහුගේ/ ඇයගේ වර්ධක සියල්ල උපයා ගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට අවවාද කිරීම් හැර කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ ඇය භාජනය වී නොමැති බව ද, *ගැසට්* නිවේදනයේ 04 වන ඡේදයට අනුව පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ ඇය මෙම තනතුර සඳහා අයදුම්කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්ගේ/
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.
නම :————;
තනතුර :————;
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :————————.

07-981

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරී පාලන අංශය

**ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

1.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2018 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බවත්, ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. විභාග පැවැත්වෙන්නේ නියමිත නගරවල පමණක් වන අතර, අදළ නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත. :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුර | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්.*—2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව, ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය.*—අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.—

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය | 100 | පැය 01 1/2 | 1 |
| 2. | විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 100 | පැය 01 1/2 | 2 |

**5.1 කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය (විෂය අංකය - 01)**

කාර්යාල ක්‍රම :

රජයේ කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.

*රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය* :

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති අනුව විනය බලතල බෙදී ඇති ආකාරය, සේවය අවසන් කිරීම, විශ්‍රාම ගැන්වීමට අදළ රීති හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සාමාන්‍ය හැසිරීම හා විනය ක්‍රියා පටිපාටියට අදළ XLVII හා XLVIII පරිච්ඡේදයන්හි සඳහන් විධිවිධාන හා ඒ සම්බන්ධව තත්කාලීනව නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිබඳ ඇති දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :

I *වැනි කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි);

II *වැනි කොටස* - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි (ලකුණු 75 යි.)

**5.2 විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම (විෂය අංකය - 02)**

ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ

ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර එම විෂයයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යයනයෙන් සමන්විත වේ :-

I *වැනි කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි)

II *වැනි කොටස* - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි. (ලකුණු 75 යි.)

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර, අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලුම විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මගින් 2018 අගෝස්තු මස 27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "***විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ***" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'විභාගයේ නම' සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.*—අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසා ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 *අයදුම්පත්‍ර.*—ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 6.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද, 7.0 ශීර්ෂයේ සිට දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදි ම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 500 ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 250ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ම ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13.0 නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, විභාග ගාස්තු ගෙවීමට අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර

ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඔබගේ ඉල්ලීම් ලිපියක් එහි පිටපතක් ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාගයට අදළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇතිබව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එස්. ටී. කොඩිකාර,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2018 ජූලි මස 12 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**
Efficiency Bar Examination for Officers in Class I Grama Niladhari Service — 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| | *විභාගයට ඉල්ලුම් කරන නගරය* | *නගර අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(*ගැසට් නිවේදනයේ* 2.0 ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්ත අනුව අනුපිළිවෙලින් දක්වන්න.)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උද.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ( *උද.* :- GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 2.1 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික්ක අංකය :————. ☐☐
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.3 සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය :————. ☐☐☐☐
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

04. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/විෂයයන් (*ගැසට් නිවේදනයේ* 05 වැනි ඡේදය බලන්න)

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |

5.0 5.1 අයත්වන ශ්‍රේණිය :————.
5.2 තනතුර :————.
5.3 අදාළ ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.
5.4 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ***සැළකිය යුතුයි.***— *ගැසට්* පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල්/උප තැපැල් කාර්යාලයෙන් අයදුම්කරුගේ නමින්ම ලබාගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

කුවිතාන්සි අංකය :————.

තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

දිනය :————.

මුදල රුපියල් :————.

7.0 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. එසේම එම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත් වන බව ද/විභාගයට නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

**ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය**

................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........... ග්‍රාම නිලධාරි වසමේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරි/ග්‍රාම නිලධාරිණී, ....................................... මහතා/මහත්මිය/මෙනෙවිය විසින්,

(i) මා ඉදිරියේ දී අත්සන් කළ බවත්,

(ii) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,

(iii) නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

(iv) පළමුවන වරට විභාගයට පෙනී සිටින බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

(නොගැලපෙන වචන කපා හරින්න)

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**උපලේඛනය I**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| කොළඹ | 1103 | කොළඹ 01 |
| කොලොන්නාව | 1106 | |
| කඩුවෙල | 1109 | |
| හෝමාගම | 1112 | |
| හංවැල්ල | 1115 | |
| පාදුක්ක | 1118 | |
| මහරගම | 1121 | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | |
| තිඹිරිගස්යාය | 1127 | |
| දෙහිවල | 1130 | |
| රත්මලාන | 1131 | |
| මොරටුව | 1133 | |
| කැස්බෑව | 1136 | |
| මීගමුව | 1203 | ගම්පහ 02 |
| කටාන | 1206 | |
| දිවුලපිටිය | 1209 | |
| මීරිගම | 1212 | |
| මිනුවන්ගොඩ | 1215 | |
| වත්තල | 1218 | |
| ජාඇල | 1221 | |
| ගම්පහ | 1224 | |
| අත්තනගල්ල | 1227 | |
| දොම්පේ | 1230 | |
| මහර | 1233 | |
| කැලණිය | 1236 | |
| බියගම | 1239 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| පානදුර | 1303 | කළුතර 03 |
| බණ්ඩාරගම | 1306 | |
| හොරණ | 1309 | |
| ඉංගිරිය | 1310 | |
| බුලත්සිංහල | 1312 | |
| මදුරාවල | 1315 | |
| මිල්ලනිය | 1318 | |
| කළුතර | 1321 | |
| බේරුවල | 1324 | |
| දොඩන්ගොඩ | 1327 | |
| මතුගම | 1330 | |
| අගලවත්ත | 1333 | |
| පාලින්දනුවර | 1336 | |
| වලල්ලාවිට | 1339 | |
| තුම්පනේ | 2103 | මහනුවර 04 |
| පූජාපිටිය | 2106 | |
| අකුරණ | 2109 | |
| පාතදුම්බර | 2112 | |
| පන්විල | 2115 | |
| උඩුදුම්බර | 2118 | |
| මිනිපේ | 2121 | |
| මැදදුම්බර | 2124 | |
| කුණ්ඩසාලේ | 2127 | |
| ගඟවට කෝරළේ | 2130 | |
| හාරිස්පත්තුව | 2133 | |
| හතරලියද්ද | 2134 | |
| යටිනුවර | 2136 | |
| උඩුනුවර | 2139 | |
| දොළුව | 2142 | |
| පාතහේවාහැට | 2145 | |
| දෙල්තොට | 2148 | |
| උඩපළාත | 2151 | |
| ගඟඉහල කෝරළේ | 2154 | |
| පස්බාගෙ කෝරළේ | 2157 | |
| ගලේවෙල | 2203 | මාතලේ 05 |
| දඹුල්ල | 2206 | |
| නාඋල | 2209 | |
| පල්ලෙපොල | 2212 | |
| යටවත්ත | 2215 | |
| මාතලේ | 2218 | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | |
| ලග්ගල පල්ලේගම | 2224 | |
| විල්ගමුව | 2227 | |
| රත්තොට | 2230 | |
| උකුවෙල | 2233 | |
| කොත්මලේ | 2303 | නුවරඑළිය 06 |
| හඟුරන්කෙත | 2306 | |
| වලපනේ | 2309 | |
| නුවරඑළිය | 2312 | |
| අඹගමුව | 2315 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| බෙන්තොට | 3103 | |
| බලපිටිය | 3106 | |
| කරන්දෙනිය | 3109 | |
| ඇල්පිටිය | 3112 | |
| නියාගම | 3115 | |
| තවලම | 3118 | |
| නෙළුව | 3121 | |
| නාගොඩ | 3124 | |
| බද්දේගම | 3127 | ගාල්ල |
| වැලිවිටිය දිවිතුර | 3130 | |
| අම්බලන්ගොඩ | 3133 | 07 |
| හික්කඩුව | 3136 | |
| කඩවත්සතර | 3139 | |
| බෝපෙ පෝද්දල | 3142 | |
| අක්මීමන | 3145 | |
| යක්කලමුල්ල | 3148 | |
| ඉමදූව | 3151 | |
| ගෝනපීනුවල | 3154 | |
| හබරාදූව | 3157 | |
| පිටබැද්දර | 3203 | |
| කොටපොල | 3206 | |
| පස්ගොඩ | 3209 | |
| මුලටියන | 3212 | |
| අතුරලිය | 3215 | මාතර |
| අකුරැස්ස | 3218 | |
| වැලිපිටිය | 3221 | |
| මාලිම්බඩ | 3224 | 08 |
| කඹුරුපිටිය | 3227 | |
| හක්මන | 3230 | |
| කිරින්ද පුහුලුවැල්ල | 3233 | |
| තිහගොඩ | 3236 | |
| වැලිගම | 3239 | |
| මාතර | 3242 | |
| දෙවිනුවර | 3245 | |
| දික්වැල්ල | 3248 | |
| සූරියවැව | 3303 | |
| ලුණුගම්වෙහෙර | 3306 | |
| තිස්සමහාරාමය | 3309 | |
| හම්බන්තොට | 3312 | |
| අම්බලන්තොට | 3315 | හම්බන්තොට |
| අඟුණකොලපැලැස්ස | 3318 | |
| වීරකැටිය | 3321 | 09 |
| කටුවන | 3324 | |
| ඕකේවෙල | 3327 | |
| බෙලිඅත්ත | 3330 | |
| තංගල්ල | 3333 | |
| වලස්මුල්ල | 3336 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කයිට්ස් | 4103 | |
| වානක්කනි | 4106 | |
| සන්දිලිපායි | 4109 | |
| තෙලිප්පායි | 4112 | |
| උඩුවිල් | 4115 | |
| කෝපායි | 4118 | |
| කරවෙඩ්ඩි | 4121 | |
| මුරුතන්කර්නි | 4124 | |
| පොයින්ට් පේද්‍රූ | 4127 | යාපනය |
| චාවාකච්චේරි | 4130 | |
| නල්ලූර් | 4133 | 10 |
| යාපනය | 4136 | |
| වේලනායි | 4139 | |
| ඩෙල්ෆ් | 4142 | |
| කරෙයිනගර් | 4145 | |
| මන්නාරම | 4203 | |
| මාන්තායි බටහිර | 4206 | මන්නාරම |
| මඩු | 4209 | |
| නානද්දාන් | 4212 | 11 |
| මුසාලි | 4215 | |
| වවුනියා උතුර | 4303 | |
| වවුනියා දකුණ | 4306 | වවුනියා |
| වවුනියා | 4309 | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | 12 |
| තුනුක්කායි | 4403 | |
| මාන්තායි නැගෙනහිර | 4406 | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | මුලතිව් |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | |
| මැරිටයිම්පත්තු | 4415 | 13 |
| වැලිඔය | 4418 | |
| පච්චිලෙයිපල්ලි | 4503 | කිලිනොච්චිය |
| කඳවලෙයි | 4506 | |
| කරච්චි | 4509 | 14 |
| පූනාකරි | 4512 | |
| කෝරලේපත්තු උතුර | 5103 | |
| කෝරලේපත්තු බටහිර | 5106 | |
| කෝරලේපත්තු | 5109 | |
| එරාවූර්පත්තු | 5112 | |
| එරාවූර් නගරය | 5115 | මඩකලපුව |
| මන්මුනේ උතුර | 5118 | |
| මන්මුනේ බටහිර | 5121 | |
| කාත්තන්කුඩි | 5124 | 15 |
| මන්මුනේපත්තු | 5127 | |
| මන්මුනේ නිරිත | 5130 | |
| පෝර්තිව්පත්තු | 5133 | |
| මන්මුනේ දකුණ | 5136 | |
| කෝරලේපත්තු දකුණ | 5139 | |
| කෝරලේපත්තු මධ්‍යම | 5142 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | අම්පාර 16 |
| පදියතලාව | 5206 | |
| මහඔය | 5209 | |
| උහන | 5212 | |
| අම්පාර | 5215 | |
| නාවින්දවේලි | 5216 | |
| සමන්තුරෙයි | 5218 | |
| කල්මුණේ දමිල | 5224 | |
| සයින්ද මුරුදු | 5225 | |
| කාර්තිවු | 5227 | |
| නින්දවුර් | 5230 | |
| අඩ්ඩාලච්චේන | 5233 | |
| ඉරක්කාමම් | 5234 | |
| අක්කරපත්තුව | 5236 | |
| අලයඩිවෙම්බු | 5239 | |
| දමන | 5242 | |
| තිරුක්කෝවිල් | 5245 | |
| පොතුවිල් | 5248 | |
| ලාහුගල | 5251 | |
| කල්මුණේ මුස්ලිම් | 5254 | |
| පදවි ශ්‍රී පුර | 5303 | ත්‍රිකුණාමලය 17 |
| කුච්චවේලි | 5306 | |
| ගෝමරන්කඩවල | 5309 | |
| මොරවැව | 5312 | |
| නගර හා කඩවත් | 5315 | |
| තඹලගමුව | 5318 | |
| කන්තලේ | 5321 | |
| කින්නියා | 5324 | |
| මුතූර් | 5327 | |
| සේරුවිල | 5330 | |
| වෙරුගල්/ඉච්චලම්පත්තු | 5333 | |
| ගිරිබාව | 6103 | කුරුණෑගල 18 |
| ගල්ගමුව | 6106 | |
| ඇහැටුවැව | 6109 | |
| අඹන්පොල | 6112 | |
| කොටවෙහෙර | 6115 | |
| රස්නායකපුර | 6118 | |
| නිකවැරටිය | 6121 | |
| මහව | 6124 | |
| පොල්පිතිගම | 6127 | |
| ඉබ්බාගමුව | 6130 | |
| ගනේවත්ත | 6133 | |
| වාරියපොල | 6136 | |
| කොබෙයිගනේ | 6139 | |
| බිංගිරිය | 6142 | |
| බමුණාකොටුව | 6149 | |
| මාස්පොත | 6151 | |
| කුරුණෑගල | 6154 | |
| මල්ලවපිටිය | 6157 | |
| මාවතගම | 6160 | |
| රිදීගම | 6163 | |
| වීරඹුගෙදර | 6166 | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| කුලියාපිටිය බටහිර | 6172 | |
| උඩුබද්දව | 6175 | |
| පන්නල | 6178 | |
| නාරම්මල | 6181 | |
| අලව්ව | 6184 | |
| පොල්ගහවෙල | 6187 | |
| පඬුවස්නුවර නැගෙනහිර | 6190 | |
| පඬුවස්නුවර බටහිර | 6193 | |
| කල්පිටිය | 6203 | පුත්තලම 19 |
| වනාතවිල්ලුව | 6206 | |
| කරුවලගස්වැව | 6209 | |
| නවගත්තේගම | 6212 | |
| පුත්තලම | 6215 | |
| මුන්දලම | 6218 | |
| මහකුඹුක්කඩවල | 6221 | |
| ආණමඩුව | 6224 | |
| පල්ලම | 6227 | |
| ආරච්චිකට්ටුව | 6230 | |
| හලාවත | 6233 | |
| මාදම්පෙ | 6236 | |
| මහවැව | 6239 | |
| නාත්තන්ඩිය | 6242 | |
| වෙන්නප්පුව | 6245 | |
| දංකොටුව | 6248 | |
| පදවිය | 7103 | අනුරාධපුරය 20 |
| කැබිතිගොල්ලෑව | 7106 | |
| මැදවච්චිය | 7109 | |
| මහවිලච්චිය | 7112 | |
| මධ්‍යම නුවරගම්පළාත | 7115 | |
| රඹෑව | 7118 | |
| කහටගස්දිගිලිය | 7121 | |
| හොරොව්පතාන | 7124 | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | |
| මිහින්තලේ | 7130 | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | |
| නච්චදූව | 7136 | |
| නොච්චියාගම | 7139 | |
| රාජාංගනය | 7142 | |
| තඹුත්තේගම | 7145 | |
| තලාව | 7148 | |
| තිරප්පනේ | 7151 | |
| කැකිරාව | 7154 | |
| පළුගස්වැව | 7157 | |
| ඉපලෝගම | 7160 | |
| ගල්නෑව | 7163 | |
| පලාගල | 7166 | |
| හිඟුරක්ගොඩ | 7203 | පොළොන්නරුව 21 |
| මැගිරිගිරිය | 7206 | |
| ලංකාපුර | 7209 | |
| වැලිකන්ද | 7210 | |
| දිඹුලාගල | 7212 | |
| තමන්කඩුව | 7215 | |
| ඇලහැර | 7218 | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* |
|---|---|---|
| මහියංගනය | 8103 | බදුල්ල 22 |
| රිදීමාලියද්ද | 8106 | |
| මීගහකිවුල | 8109 | |
| කන්දෙකැටිය | 8112 | |
| සොරණාතොට | 8115 | |
| පස්සර | 8118 | |
| ලුණුගල | 8119 | |
| බදුල්ල | 8121 | |
| හාලිඇල | 8124 | |
| ඌව පරණගම | 8127 | |
| වැලිමඩ | 8130 | |
| බණ්ඩාරවෙල | 8133 | |
| ඇල්ල | 8136 | |
| හපුතලේ | 8139 | |
| හල්දුම්මුල | 8142 | |
| බිබිල | 8203 | මොනරාගල 23 |
| මඩුල්ල | 8206 | |
| මැදගම | 8209 | |
| සියඹලාණ්ඩුව | 8212 | |
| මොණරාගල | 8215 | |
| බඩල්කුඹුර | 8218 | |
| බුත්තල | 8221 | |
| වැල්ලවාය | 8224 | |
| කතරගම | 8227 | |
| තණමල්විල | 8230 | |
| සෙවනගල | 8233 | |
| ඇහැලියගොඩ | 9103 | රත්නපුර 24 |
| කුරුවිට | 9106 | |
| කිරිඇල්ල | 9109 | |
| රත්නපුර | 9112 | |
| ඉඹුල්පෙ | 9115 | |
| බලංගොඩ | 9118 | |
| ඕපනායක | 9121 | |
| පැල්මඩුල්ල | 9124 | |
| ඇලපාත | 9127 | |
| අයගම | 9130 | |
| කලවාන | 9133 | |
| නිවිතිගල | 9136 | |
| කහවත්ත | 9139 | |
| ගොඩකවෙල | 9142 | |
| වැලිගෙපොල | 9145 | |
| ඇඹිලිපිටිය | 9148 | |
| කොලොන්න | 9151 | |
| රඹුක්කන | 9203 | කෑගල්ල 25 |
| මාවනැල්ල | 9206 | |
| අරණායක | 9209 | |
| කෑගල්ල | 9212 | |
| ගලිගමුව | 9215 | |
| වරකාපොල | 9218 | |
| රුවන්වැල්ල | 9221 | |
| බුලත්කොහුපිටිය | 9224 | |
| යටියන්තොට | 9227 | |
| දෙහිඕවිට | 9230 | |
| දැරණියගල | 9233 | |

07-951

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.08.23 දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තව ද විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2018" ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

**සටහන** 1 : අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් එවීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි ප්‍රතිවිපාක අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තීයේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කුසලතාවය මැන බැලීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ 13.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතාවය මත පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේ දී පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය පත්වීම් ලබා ගැනීමට ඇති මනාපය අනුපිළිවෙලින් දැක්විය යුතුය.

**සටහන** 2- එකම පාසලට ඉල්ලා ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී සුදුසුකම් ලැබූවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද, නිශ්චිත ලකුණු ලබාදීමේ පරිපාටියකට අනුව සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන වන බැවින් වසර 05 ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

2.5 පුරප්පාඩු ලේඛනය :

| පළාත | ජාතික පාසල් | | පළාත් පාසල් | |
|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| බස්නාහිර | √ | √ | - | - |
| මධ්‍යම | √ | √ | √ | √ |
| දකුණ | √ | √ | - | - |
| උතුර | √ | √ | - | - |
| නැගෙනහිර | √ | √ | - | - |
| වයඹ | √ | √ | √ | √ |
| උතුරුමැද | √ | - | - | - |
| සබරගමුව | √ | - | √ | √ |
| ඌව | √ | √ | - | - |

**සටහන.** 3- පළාත් සභා පාසල් සඳහා අයදුම්කරන්නන් එම පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාව ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට

ද රජයේ මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

(v) 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලටද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව G-E- 01-2016 හි රු. 27,740-300 x 6-380x7-445x2-රු.33,090/-(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. පත්වීම්ලාභීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු.32,200/-හි පිහිටුවනු ලැබේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව හා අංක අමප/17/0653/742/009 හා 2017.05.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2018.08.23 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක්;

හෝ

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති සාමාන්‍යවේදී උපාධියක්;

හෝ

(III) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් ඕනෑම උපාධියක්;

සමග

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබාගත් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක්;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් උපදේශනය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

*සටහන* 4.-සෑම අයදුම්කරුවකුම ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව අ.පො.ස.(සා.පෙ.) විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

06. *වයස් සීමාව* :-

2018.08.23 වැනි දිනට වයස

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 35

ඒ අනුව, 2000.08.23 හෝ ඊට පෙර හා 1983.08.23 වැනි දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

07. *අනෙකුත් අවශ්‍යතා* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

08. *අයදුම්කිරීමේ ක්‍රමය* :

8.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 5.5 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද 6.0 සිට ඉතිරි ශීර්ෂ අනිකුත් පිටුවලට ද ඇතුළත් වන පරිදි තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.(අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට් නිවේදනයේ* දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න

පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්නපිළිබඳවත් අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

8.3 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින්, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු,කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු,ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇත'යි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් 011-2784232 දරන ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට පෙනී සිටීම :

9.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කොට විභාග යට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන 5*.-අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

10. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් එක් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ වලංගු රියදුරු බලපත්‍රය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම* :
අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගය කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

12. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

12.1 මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් කොළඹ දී පවත්වනු ලැබේ.

12.2 ලිඛිත විභාගයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත්විය යුතුය.

12.3 සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ, එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යය ම විය යුතුය.

12.4 අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

13. විෂය නිර්දේශය :

13.1 ලිඛිත විභාගය

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. සියලුම අයදුම්කරුවන් එම ප්‍රශ්න පත්‍ර දෙක සඳහාම පෙනී සිටීම අනිවාර්යය වේ.

(I) *අභියෝග්‍යතාව* - කාලය පැය 01 යි (ලකුණු 100 යි) අයදුම්කරු සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(II) *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01යි. (ලකුණු 100 යි) ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනීම හා අධ්‍යාපන නවීකරණ පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

*සටහන 6 :* ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද'යි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

13.3 ප්‍රායෝගික පරීක්ෂණය :

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා විනාඩි 05 කට නොඅඩු කාලයක් ලබාදෙනු ලැබේ.මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| *අනු. අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිළිබව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

*සටහන 7 :* ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

ගුරු වෘත්තියේදී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

14. විභාග ගාස්තු :

14.1 විභාග ගාස්තුව රු.600/-කි.ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින් ඕනෑම තැපැල් /උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. විභාග ප්‍රතිඵල :

15.1 ලිඛිත විභාගයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

16. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :

අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන 01, 02 හා 03 පමණක් භාවිතා කරන්න.

**උපලේඛනය 01**

| *භාෂා මාධ්‍යය* | *කේත අංකය* |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |

**උපලේඛන 02**

| *පාසල් වර්ගය* | *කේත අංකය* |
|---|---|
| ජාතික | 1 |
| පළාත් | 2 |

**උපලේඛන 03**

| *පළාත* | *කේත අංකය* |
|---|---|
| මධ්‍යම පළාත | 2 |
| වයඹ පළාත | 6 |
| සබරගමුව පළාත | 9 |

17. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ අංක 11.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරනලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

18. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

19. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

20. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතු වේ.

21. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්.

2018 ජූලි මස 11 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

*අධ්‍යාපන අමාත්‍යාංශය*

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යය
පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා
ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට
උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018

Open Competitive Examination to Recruit Graduates to Grade 3-I (a) of Sri Lanka Teachers' Service for Sinhala and Tamil Medium School Student Counselling in National and Provincial Schools in the Island - 2018

1.0 අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන 01 භාවිතා කර කේත අංකය යොදන්න.

භාෂා මාධ්‍යය

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීම

2.1 පාසල් වර්ගය
(පාසල් වර්ගය උපලේඛන අංක 02 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ ලියන්න)

2.2 පළාත් පාසලක් නම් පළාතේ කේත අංකය
(පළාත් කේත අංකය උපලේඛන අංක 03 අනුව කොටුව තුළ ලියන්න)

03.
3.1 සම්පූර්ණ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) (උදා:-AMRAKOON MUDIYANSELAGE NAMAL HERATH)

:————.

3.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (උදා:- HERATH.A.M.N.) :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

4.0 වර්තමාන ලිපිනය (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) :————. (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

5.0

5.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

5.2 විවාහක/අවිවාහක බව : අවිවාහක-1 විවාහක-2 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.3 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

5.4 2018.08.23 දිනට වයස : අවු : | | | මාස : | | | දින : | | |

5.5 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී-1 පුරුෂ -0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) | |

6.0 අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

| *අ.පො.ස.(සා.පෙළ) විභාගය* වර්ෂය …………… විභාග අංකය ………… | | *අ.පො.ස.(උ.පෙළ) විභාගය* වර්ෂය ………… විභාග අංකය ……… |
|---|---|---|
| *විෂයය* *සාමර්ථ්‍ය* | *විෂයය* *සාමර්ථ්‍ය* | *විෂයය* *සාමර්ථ්‍ය* |
| 1 | 6 | 1 |
| 2 | 7 | 2 |
| 3 | 8 | 3 |
| 4 | 9 | 4 |
| 5 | 10 | |

7.0 උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :
7.1 උපාධිය :————.
7.2 නිකුත් කළ විශ්වවිද්‍යාලය :————.
7.3 උපාධිය වලංගු දිනය :————.
7.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
7.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

8.0 ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් පිළිබඳ විස්තර :
8.1 ඩිප්ලෝමාව :————.
8.2 නිකුත් කළ ආයතනය :————.

8.3 ඩිප්ලෝමා සහතිකය/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය වලංගු දිනය :————..
8.4 ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
8.5 ඩිප්ලෝමාව ලබා ඇති මාධ්‍යය :————.

9.0 විභාග ගාස්තු ගෙවීම පිළිබඳව විස්තර :
9.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
9.2 කුවිතාන්සියේ අංකය :————.
9.3 නිකුත් කළ කාර්යාලය :————.
9.4 දිනය :————.

මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිටදී .......... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරිගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 *අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

.........................................................................................මහතා/ මහත්මිය/ මෙනවියගේ අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

07-920

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.